# සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් -- 11 වන කොටස

## The Historical and International Foundations of the Socialist Equality Party—Part 11

*එක්සත් ජනදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් ලියවිල්ලෙහි අවසාන කොටස මේ සමග පල වේ. පසුගිය අගෝස්තු 3-9 දිනවල පැවති සසප ආරම්භක සම්මේලනයේ දී මෙම ලියවිල්ල පුලුල් ලෙස සාකච්ඡා කරනු ලැබ ඒකමතිකව සම්මත කර ගන්නා ලදි. සම්මේලනයේ දී සම්මත කෙරුනු සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ද මීට පෙර ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පල විය.*

### භූගෝලීයකරනය හා ජාතික ප්‍රශ්නය

229. සෝවියට් සංගමය විසුරුවා හැරීමේ දේශපාලන ප්‍රතිවිපාකයන්ගෙන් එකක් වූයේ, නව රාජ්‍යයන් නිර්මානය කිරීම ඉල්ලා සිටින ජාතිකවාදී හා බෙදුම්වාදී ව්‍යාපාර පොලඹවාලීම යි. පශ්චාත් දෙවන ලෝක යුද්ධ භූ-දේශපාලනික අකෘතිය තුල පවත්වාගෙන ගිය බහු ජාතික රාජ්‍යයන්, සෝවියට් බිඳවැටීමෙන් පසු කාලයේ, ජාතික, වාර්ගික හා ආගමික පදනම් සහිත වාර්ගික ආතතීන් යලි හිස එසවීම මගින් හෙලිදරව් විය. මේ හැම සිද්ධියකදී ම පාහේ එක්සත් ජනපදය හා යුරෝපීය අධිරාජ්‍යවාදී බලවත්තු තමන්ගේ ම භූ-දේශපාලනික අරමුනු වෙනුවෙන්, මෙම ආතතීන් අවුලුවාලූහ. 1990 ගනන් මුල යුගෝස්ලාවියාව බිඳී යාම, එහි සියලු ම බිහිසුනු ප්‍රතිවිපාක සමඟ, ඇමරිකානු හා ජර්මන් අධිරාජ්‍යවාදීන්ගේ මූලෝපායික අරමුනුවල ප්‍රතිඵලය විය. විශේෂයෙන්ම එක්සත් ජනපදය සම්බන්ධයෙන් ගත්විට, පැරනි සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය බිඳ වැටීම, හා නව "ස්වාධීන" රාජ්‍ය නිර්මානය කිරීම, කොකේසස්හි හා මධ්‍යම ආසියාවේ ඇමරිකානු බල ප්‍රක්ෂේපනය සඳහා මහඟු අවස්ථාවන් සම්පාදනය කලේය. රුසියානු දේශසීමාවන් ඇතුලත පවා චෙච්නියාව තුල හිස එසවූවාක් වැනි බෙදුම්වාදී ව්‍යාපාර දෙස, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව නෙත් යොමුකලේ, ගෝලීය ආධිපත්‍ය සඳහා වූ සිය ගමනේ ශක්‍ය අවස්ථාවන් ලෙස සලකා ගෙන ය.

230. කෙසේවුව ද, වාර්ගික තල්ලුව උත්සන්නවීමට යටින් පැවතියේ දේශපාලන ගනන්බැලීම් පමනක් නො වේ. ජාත්‍යන්තර කමිටුව පැහැදිලි කල භූගෝලීයකරනයේ වර්ධනය එයට ඉන්ධන සැපයීය.

> නව භූගෝලීය ආර්ථික සබඳතා, නව වර්ගයක ජාතික ව්‍යාපාරයකට වෛෂයික තල්ලුවක් ද සම්පාදනය කර තිබේ. භූගෝලීය වශයෙන් නව සංචලිත ප්‍රාග්ධනය කුඩා භූමි ප්‍රදේශවලට, කෙලින්ම ලෝක වෙලඳපොල සමඟ පිරිද්දීගැනීමේ හැකියාව ලබා දී තිබේ. හොංකොං, සිංගප්පූරුව හා තායිවානය නව වර්ධන ආදර්ශ බවට පත්ව ඇත. ඇති තරම් ප්‍රවාහන සබඳතා, පොදු කාර්ය ව්‍යුහය හා ලාභ ශ්‍රම සැපයුමක් තිබෙන කුඩා වෙරලාසන්න ප්‍රදේශයක්, නිෂ්පාදන ශක්‍යතාවයෙන් වඩා අඩු, ප්‍රත්‍යන්ත ප්‍රදේශයකින් යුත් විශාල රටකට වඩා, අන්තර්ජාතික ප්‍රාග්ධනය සඳහා ආකර්ශනීය පදනමක් විය හැකිය. [141]

231. කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුවේ අවශ්‍යතාවය තුල, බෙදුම්වාදී ව්‍යාපාර පිලිබඳව අතිශය විවේචනාත්මක හා සතුරු ආකල්පයක් පවා ගැනීම අවශ්‍යවන බව ජාත්‍යන්තර කමිටුව අවධාරනය කලේය. "ස්වයංනිරනය සඳහා ජාතීන් සතු අයිතිය" යන අධානග්‍රාහී සටන්පාඨය පුනරුච්ඡාරනය කිරීම, ජාතික ඉල්ලීම් පිලිබඳ සංයුක්ත ඓතිහාසික, සමාජ-ආර්ථික හා දේශපාලන විශ්ලේෂනයක් සඳහා ආදේශකයක් නො වේ. සමකාලීන ජාතික - බෙදුම්වාදී ව්‍යාපාර පොදුවේ, අමු ප්‍රතිගාමී සමාජ-ආර්ථික හා දේශපාලන ඉදිරිදර්ශනයන් මගින් අංගලක්ෂිතව ඇති විටෙකදී මෙය වඩාත් අවශ්‍යය. වෙනස් වූ ඓතිහාසික අවධීන්හි ජාතික ව්‍යාපාර සසඳමින් ජාත්‍යන්තර කමිටුව මෙසේ ලිවීය.

> ඉන්දියාවේ හා චීනයේ ජාතික ව්‍යාපාරය අසමාන ජන කොටස්, අධිරාජ්‍යවාදයට එරෙහි පොදු අරගලයක් තුල ඒකාබද්ධ කිරීමේ ප්‍රගතිශීලී කර්තව්‍යය, - එය වනාහි ජාතික ධනේශ්වරයේ නායකත්වය යටතේ සාක්ෂාත් කල නොහැකි දෙයක් ලෙස ඔප්පු කෙරුනු කර්තව්‍යයකි - මතු කලේය. ජාතිකවාදයේ නව රූපය සූරාකන්නන්ගේ යහපත සඳහා, පවතින රාජ්‍යයන් බෙදා වෙන් කිරීමේ එල්ලය ඇතිව ජනවාර්ගික, භාෂාමය හා ආගමික පිලිවෙත් දිගේ බෙදුම්වාදය වගා කරයි. මෙවන් ව්‍යාපාර අධිරාජ්‍යවාදයට එරෙහි

අරගලයක් සමග ගැටීවත් නැත. ඒවා මොනම අර්ථයකින් හෝ පීඩිත ජනතාවන්ගේ ප්‍රජාතන්ත්‍රීය අභිලාෂයන් අන්තර්ගත කරගන්නේ වත් නැත. ඒවා කම්කරු පන්තිය බෙදීමට ද, පන්ති අරගලය ජනවාර්ගික, ප්‍රජාගනවාදී යුද්ධවලට අපසරනය කිරීමට ද උදව් වෙයි. [142]

232. මතු දැකිය හැකි පරිද්දෙන්ම ස්පාටසිස්ට් ලීගයේ සුලු-ධනපති රැඩිකල්වාදීහු විවිධ බෙදුම්වාදී ප්‍රවනතාවන්ට අවස්ථාවාදී ලෙස අනුගතවෙමින් කියා සිටියේ, ඩේවිඩ් නොර්ත් "ස්වයංනීර්න අයිතිය 'අහෝසිකර' ඇති" බවයි.[143] ඔවුන්ට ම ආවේනික මෙම හෙලාදැකීමේ සූත්‍රගත කිරීමට අමතරව ස්පාටසිස්ට් වරුන්ගේ ප්‍රහාරය පදනම්ව ඇත්තේ, ස්වයං - නීර්නයේ ප්‍රශ්නයට ලෙනින් හා ට්‍රොට්ස්කි යන දෙදෙනාගේ ම ආකල්පය පිලිබඳ මුසාකරනය මතය. ඔවුන් කිසි විටෙකත් ස්වයං-නීර්නයේ ඉල්ලීම ඕනෑම අවස්ථාවකදී හා සියලු අවස්ථාවන්හි දී මාක්ස්වාදීන් ආපසු ගෙවීමට බැඳී සිටින යම් වර්ගයක පොරොන්දු නෝට්ටුවක් ලෙස නිර්වචනය නොකලහ. තවද, ඔවුන් කිසි විටෙකත් මෙම ඉල්ලීම, ජාත්‍යන්තර විප්ලවවාදී පන්තියක් ලෙස කම්කරු පන්තියේ අවශ්‍යතාවන්ගෙන් ඉහලට ඔසවා නොතැබූහ. 1913 දී ලෙනින් ප්‍රවේශමෙන් නිර්වචනය කල පරිදි ඓතිහාසිකව පන්නර ගැන්වුන, විවිධ වර්ගයේ ජාතික ව්‍යාපාරයන්හි එක් හෝ තවත් දේශපාලන සංවිධානයක් විසින් ගෙනයනු ලබන ස්වයං නීර්නයේ ඉල්ලීම්වල වෛෂයික අන්තර්ගතය පිලිබඳව බැරෑරුම් තක්සේරුවක් කිරීමට මාක්ස්වාදීන් දැඩිලෙස බැඳී සිටියි. හජාජාක විස්තර කල පරිදි:

> එක් සමයක ප්‍රගතිශීලී හා විප්ලවවාදී අන්තර්ගතයක් පැවති සූත්‍ර පාඨ තවත් කාලයකදී මුලුමනින්ම වෙනස් අර්ථයකින් ගැනීම මාක්ස්වාදී ව්‍යාපාරයේ ඉතිහාසය තුල බොහෝ විට දක්නට ලැබුනු දෙයකි. ජාතික ස්වයං නීර්නය ඉදිරිපත් කරන්නේ හරියටම ඒ හා සමාන තත්වයකි.
>
> ලෙනින් අවුරුදු අසූවකට අධික කාලයකට පෙර නිර්වචනය කල ආකාරයට වඩා මුලුමනින්ම වෙනස් අර්ථයක් අද ජාතික ස්වයංනීර්න අයිතිය විසින් දරනු ලැබේ. ස්වයංනීර්න අයිතිය ඉදිරිපත් කර තිබෙන්නේ මාක්ස්වාදීන් විසින් පමනක් නොවේ. එය පසුගාමී රටවල ජාතික ධනේශ්වරයන් විසින් ද, අධිරාජ්‍යවාදීන් විසින් ද ඉදිරිපත් කරනු ලැබ ඇත. පලමුවන ලෝක යුද්ධය අවසානයේ පටන් එක් හෝ තවත් අධිරාජ්‍ය බලයක් විසින් පවත්නා ප්‍රදේශ බෙදාගැනීම එල්ල කරගත් සැලසුම් යුක්තිසහගත කිරීම සඳහා මෙම අයිතිය මතු කරනු ලැබ ඇත. [144]

233. බොස්නියාව, ඉන්දියාවේ පන්ජාබ් හා කාෂ්මීර ප්‍රාන්ත, ක්විබෙක් හා ශ්‍රී ලංකාව තුල ජාතික-බෙදුම්වාදී ව්‍යාපාර ස්පාටසිස්ට් ලීගය විසින් වැලඳගෙන ඇති අතර ඒවා හරියට ම ජාතික ස්වයංනීර්න ඉල්ලීමේ ප්‍රතිගාමී ස්වභාවය පැහැදිලි ලෙස ප්‍රකාශයට පත්කරන ව්‍යාපාරයි. බොස්නියාව සම්බන්ධ ප්‍රශ්නයේ දී, යුගෝස්ලාවියාව කැබලි කිරීමේ පුලුල් ව්‍යාපාරයක අවශ්‍යතාවන්ට සේවය කල, ජනගහනයේ මුස්ලිම් කොටසගේ ආගම මුල්කරගත් ජාතිකවාදය අධිරාජ්‍යවාදය විසින් ගසාකන ලදී. පන්ජාබයේ හා කාෂ්මීරයේ ජාතික බෙදුම්වාදය පුම්බාලීමේ දී ස්පාටසිස්ට්වරු, මෙම ප්‍රදේශ මුල්කරගත් ව්‍යාපාරයන්ගේ, විශේෂයෙන්ම කාෂ්මීරය සම්බන්ධ ප්‍රශ්නයේ දී, කලාපයේ ප්‍රධාන ජාතික රාජ්‍යයන් අතර පුලුල් භූ-මූලෝපායික ගැටුම්වලට බෙදුම්වාදී ව්‍යාපාරයන්හි බැඳීම්වල තරයේ ම ප්‍රතිගාමී වූ ස්වභාවය, නොසලකා හැරීමේ පිලිවෙත තෝරා ගත්හ. ක්විබෙක්හි දී ජාතික ව්‍යාපාරය, දශක ගනනාවක් තිස්සේ කැනේඩියානු ධනේශ්වරයේ විවිධ කොටස් අතර එකිනෙකට පටහැනි අවශ්‍යතාවන් මත කෙරීගෙන ගිය අරගලයන්ගේ මාධ්‍යයන් ලෙස සේවය කලේය. කම්කරු පන්තියට සම්බන්ධිතව ක්විබෙක් පාලක පන්තිය ඔන්ටාරියෝ හෝ සස්කෙචුවාන් ඇන්ග්ලෝෆෝනි ධනේශ්වරයට වඩා අඩු නිර්දය බවක් පෙන්නුවේ නැත. අවසාන වශයෙන් දෙමල ජාතිකවාදය හුවාදැක්වීමේ දී ස්පාටසිස්ට් වරු, එල්ටීටීඊයේ (දෙමල කොටි) බෙදුම්වාදී ඉදිරිදර්ශනයට දේශපාලනික යටත් වීමක් ද, සිංහල හා දෙමල කථාකරන කම්කරු පන්තිය ශ්‍රී ලංකාවේ ධනේශ්වර රාජ්‍යයට එරෙහිව පොදු අරගලයක් තුල ඒකාබද්ධ කිරීම සඳහා ට්‍රොට්ස්කිවාදීන් ගෙන ගිය දශක ගනනාවක් දිගු අරගලය හෙලාදැකීමක් ද නියෝජනය කලහ. ජාතික ව්‍යාපාර මත පුරාවෘත්තමය හා සුපිරි ඓතිහාසික ස්වභාවයක් ආරෝපිත කිරීමේ දී ස්පාටසිස්ට් වැනි සුලු-ධනපති ප්‍රවනතාවෝ, පීඩිත සුලු ජන සමූහයන් අතර ජාතික මනෝගතීන් මුල් බැස්සවීම සඳහා කම්කරු පන්තියේ අවස්ථාවාදී සංවිධාන විසින් කරන ලද දේශපාලන පාවාදීමේ බලපෑම නොතකා හලහ. දෙමල ජනතාව පිලිබඳ ප්‍රශ්නයේ දී, 1960 හා 1970 ගනන්වල දී ජාතිකවාදී ප්‍රවනතාවන්ගේ වැඩීයාම, බැඳී තිබුනේ සම සමාජ පක්ෂයේ දේශපාලන පාවාදීම් සමග ය. සියල්ලටත් වඩා 1964 වසරේ ධනපති සභාග ආන්ඩුවට එහි ඇතුල්වීම හා ඉන්පසුව දෙමල භාෂාවට එරෙහි නොපනත්කම් ව්‍යවස්ථා ගතකල 1972 දී බලගැන්වූ ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීමේ ලා එහි සහභාගිත්වයයි.

234. ස්වයංනිර්න ඉල්ලීමේ වැදගත්කම හා ධනේශ්වර ජාතිකවාදයට ද එහි සුලු-ධනපති ක්ෂමාලාපකයන්ට ද එරෙහි සිය අරගලය පිලිබඳව ජාත්‍යන්තර කමිටුවේ විශ්ලේෂනය. හතරවන ජාත්‍යන්තරයේ විප්ලවකාරී ජාත්‍යන්තර පදනම් ශක්තිමත් කිරීම සඳහා ඉමහත් ලෙස දායක විය. සෝසසසං විසුරුවා හැරීමෙන් පසුව හා එම සිද්ධිය මුල්කරගෙන හටගත් දැවැන්ත දේශපාලන ව්‍යාකුලත්වය මඟින්, අව්‍යාජ ජාත්‍යන්තර ක්‍රියාමාර්ගයක් සඳහා කම්කරු පන්තිය මෙහෙයවිය හැක්කේ නොනවතින විප්ලවයේ පදනම මත පමනක්ය යන ජාත්‍යන්තර කමිටු විශ්ලේෂනය සනාථ කෙරිනි. □

## භූගෝලීයකරනය හා වෘත්තීය සමිති

235. ස්ටැලින්වාදී නිලධරයන් ධනපති කතිපයාධිකාරීන් බවට පරිවර්තනය වන අතරතුර ඕස්ට්‍රේලියානු හා යුරෝපීය පැරනි කම්කරු හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ සමාජවාදය සමඟ ඔවුන්ට පැවති සම්ප්‍රදායික බැඳීම අතහැර දමමින් සමාජ වැඩපිලිවෙලවල්වලට හා සමාජ තත්වයන්ට තියුනු ප්‍රහාර එල්ල කරන වාහකයන් බවට පත්වූහ. ඉන්දියාවේ කොන්ග්‍රස් පක්ෂය වැනි එක් හෝ තවත් ආකාරයකින් සමාජවාදය හෝ ජාතික ප්‍රතිසංස්කරන සමඟ නාමිකව අනන්‍යවී සිටි ධනේශ්වර ජාතිකවාදී පක්ෂ, කප්පාදු පියවර හා රාජ්‍ය කර්මාන්තයේ පුද්ගලීකරනය ක්‍රියාත්මක කරමින් ගෝලීය මූල්‍ය ප්‍රාග්ධනය සමඟ ක්‍රියාකාරීව පෙලගැසුනහ.

236. එක්සත් ජනපදයේ ඒඑෆ්එල්-සීඅයිඕ සංවිධාන ද ඇතුලු වෘත්තීය සමිති නිලධරයේ පරිහානිගත වීම මෙම ක්‍රියාවලිය පිලිබඳ එක් නිදසුනකි. ඒඑෆ්එල්-සීඅයිඕ ව ගොඩනැගීමට දායක වූ බොහෝ වෘත්තීය සමිති මහජන අරගලවලට නායකත්වය දෙමින් කම්කරු පන්තිය සඳහා සැබෑ ජයග්‍රහන දිනාගත්හ. ඒ, වෘත්තීය සමිති ඩිමොක්‍රටික් පක්ෂයේ දේශපාලන ආධිපත්‍ය හා ලාභ පද්ධතිය පිලිගන්නා අතරතුර ය. ඇමරිකානු ධනවාදය නැඟෙමින් තිබෙන කාලයෙහි, ජාතික ප්‍රතිසංස්කරනයේ පිලිවෙතක් මත පදනම්ව සිය සාමාජිකයන්ගේ ජීවන තත්වයන් ඉහල නැංවීමට තවමත් වෘත්තීය සමිතිවලට අවකාශ තිබුනි. කෙසේ වුව ද, භූගෝලීයකරනයේ හා ගැඹුරුවන ඇමරිකානු ධනවාදයේ බලපෑම යටතේ මෙම ඉදිරිදර්ශනය අවලංගු වී ගියේය. වෘත්තීය සමිතිවල ප්‍රතිපත්තිය වෙන කවරදාකටත් වඩා විවෘත ලෙස ව්‍යාපාර ගැති ස්වභාවයක් ගත්තේය. ව්‍යාපාරික අවශ්‍යතාවලින් ස්වාධීනව යමක් ඉතිරිව තිබුනේ නම් ඒවා ද අතහැර දමන ලදී. 1980 ගනන් පුරා ම එක්සත් ජනපද ඒඑෆ්එල්-සීඅයිඕව වර්ජන එකක් පසුපස තවෙකක් වශයෙන් හුදෙකලා කර පාවාදීම සඳහා ක්‍රමානුකූලව වැඩ කර තිබේ. නිලධරය තමන් නියෝජනය කරනවායයි කිවූ කම්කරුවන් වෙතින් සිය ආදායම් මූලාශ්‍ර වඩ වඩාත් ඉවත් කර ගත්හ. මෙම ක්‍රියාවලියේ දී නිලධරය, කම්කරු පන්තියට සතුරු හා දුරස්ත සමාජ අනන්‍යතාවක් පිහිටුවා ගත්හ. සිය පාලක පැලැන්තියේ වෙනස්වන සමාජ ස්වභාවය හඳුනාගැනීමට අසමත් වූ, වෘත්තීය සමිති "කම්කරු සංවිධාන" ලෙසට කල ගතානුගතික හැඳින්වීම එන්ට එන්ටම හිස් බවට පත්විය. යථාර්තයේ දී වෘත්තීය සමිති, "කම්කරු සංවිධාන" නොව කම්කරු පන්තියට ගැඹුරින්ම විරුද්ධ හා එයින් පරත්වාරෝපනය වූ, විශේෂිත සුලු - ධනපති තට්ටුවකගේ අවශ්‍යතාවන්ට සේවය කරන හා එමගින් පාලනය කරන සංවිධානයන් ය.□

237. ධනේශ්වර නිෂ්පාදනයේ භූගෝලීයකරනය හා ජාත්‍යන්තර කම්කරු පන්තියේ කර්තව්‍යයෝ යන 1993 ව'කර්ස් ලීගයේ ඉදිරිදර්ශන ලියවිල්ල මෙසේ පැහැදිලි කලේ ය.□

> ජාතික කර්මාන්තය හා ජාතික ශ්‍රම වෙලඳපොල ආරක්ෂා කිරීමේ පැරනි කම්කරු සංවිධානවල මූලික දිශානතියට, ගෝලීය ඒකාග්‍රිත නිෂ්පාදනය හා ප්‍රාග්ධනයේ පෙර නොවූ විරූ සංචලනය මඟින් වල කැපිනි. සැම රටක් තුලම මෙම නිලධාරිවාදී පැලැන්තීන්ගේ ක්‍රියා කලාපය, සහන සඳහා හාම්පුතුන්ට හා රජයට බලපෑම් දැමීමේ තැනෙහි සිට ප්‍රාග්ධනය ආකර්ශනය කර ගැනීමට හැකිවන පරිදි හාම්පුතුන්ට සහන සැලසීම සඳහා කම්කරුවන්ට බලපෑම් කිරීම දක්වා පරිවර්තනය වී තිබේ.[145] □

238. වෘත්තීය සමිතිවල ක්‍රියාකලාපය හා ඒවායේ වත්මන් වර්ධනය පිලිබඳ විශ්ලේෂනයේ පදනම මත ව'කර්ස් ලීගය මෙසේ ලිවීය.□

> ඒඑෆ්එල්-සීඅයිඕ නිලධරයේ පාවාදීම්වලට සින්ඩිකල්වාදී ඉදිරිදර්ශනයකින් සමතුලිතයක් ලබාදෙන උපායික අවස්ථාවාදය හා වෘත්තීය සමිති වන්දනාව ව'කර්ස් ලීගය ප්‍රතික්ෂේප කරයි. එය පලමු කොටත් අන් සියල්ලට ඉහලිනුත් ආමන්ත්‍රනය කරන්නේ කම්කරු පන්තියේ වැඩිදියුනු, පෙරටු බල ඇනියට වන අතර, මාක්ස්වාදී සම්ප්‍රදායන් ගෙන් බොහෝ කොට ම වියෝකර තිබූ කම්කරුවන්ගේ නව පරම්පරාවක් මාක්ස්වාදීන් ලෙස අධ්‍යාපන ගතකර ගැනීමට එය උත්සුක වෙයි. එබැවින්, කම්කරු පන්තියට සිය පැරනි සංවිධානවල දේශපාලන චරිතය හා ඒවා නියෝජනය කරන සමාජ බලවේග පිලිබඳව කෙලින් ම හා එක එල්ලේ ම පැහැදිලි කල යුතුයයි එය අවධාරනය කරයි. □

ව'කර්ස් ලීගය වෘත්තීය සමිති හෝ ඒවා තුල සිටින කම්කරුවන් අමතක කරන්නේ නැත. ඔවුන් සිරවී සිටින සංවිධානවල ප්‍රතිගාමී ස්වභාවය පිලිබඳ වගකීම කම්කරුවන් දැරිය යුතුයයි අප කියා නොසිටිමු. හැකි සෑම තැනකදී ම, වෘත්තීය සමිති ෆැසිස්ට්-පාලනයට නතුව තිබුනේ වුවත්, විප්ලවවාදී ක්‍රියාමාර්ගයක් මත කම්කරුවන් බල මුලුගැන්වීමේ අරමුන ඇතිව පක්ෂය ඒවා තුල මැදිහත් වෙයි. එහෙත්, මෙම සංවිධාන තුල විප්ලවවාදී වැඩ කටයුතුවල අත්‍යවශ්‍ය දෘෂ්ටිය වන්නේ ඒඑෆ්එල්-සීඅයිඕ හා එයට සම්බන්ධ වෘත්තීය සමිතිවල ස්වභාවය පිලිබඳ න්‍යායික පැහැදිලි කමයි. අප දැඩි අවංක භාවයකින් යුතුව මෙම අප්‍රසන්න කරුනු කම්කරුවන්ට පැහැදිලි කල යුත්තෙමු.□

ඒඑෆ්එල්-සීඅයිඕව කම්කරු නිලධරයේ අවශ්‍යතාවන්හි සංවිධානාත්මක ප්‍රකාශනය ලෙස සැලකිය යුතුයයි ද, එය "අල්ලාගෙන" විප්ලවවාදී අරගලයේ උපකරනයක් බවට පත්කල හැකි යයි ද කියන අදහස ව'කර්ස් ලීගය මුලුමනින්ම ප්‍රතික්ෂේප කරයි. [146] □

239. ව'කර්ස් ලීගය වෘත්තීය සමිති මත පදනම් වූ කම්කරු පක්ෂයක් සඳහා වූ ඉල්ලීම අස්කර ගත්තේය. මෙම උපායික ඉල්ලීම යෝග්‍ය වූයේ, සීමිත ආකාරයකට නමුත් වෘත්තීය සමිති තවමත් කම්කරු පන්තියේ ආරක්ෂක සංවිධාන ලෙස කටයුතු කල හා කම්කරු සමූහයන්ගේ සහයෝගය ගොනුකර ගන්නා කාලයක් තුල ය. 1990 ගනන්වල තවදුරටත් එය එසේ නො වේ.□

## සමාජවාදී සමානතා පක්ෂය ගොඩනැගීම

240. 1995 ජූනි මාසයේ දී ව'කර්ස් ලීගය, සමාජවාදී සමානතා පක්ෂය බවට පරිවර්තනය වීමේ ක්‍රියාවලියකට මුල පිරීය. මෙම ක්‍රියාවලිය හුදෙක් නම වෙනස් කිරීමට පමනක් සීමා වූවක් නො වී ය. දිගුකාලීන වැඩ රටාවන්ගේ වෙනසක් ද, එක්සත් ජනපදය තුලත් ජාත්‍යන්තරවත් කම්කරු පන්තියට විප්ලවවාදී සමාජවාදී ව්‍යාපාරයේ සම්බන්ධතාවය වර්ධනය කිරීම ද එයට ඇතුලත් බැවින් මෙම පරිවර්තනය සැලකිය යුතු කාල වකවානුවක් තිස්සේ ගෙන යා යුතු බව එය අපේක්ෂා කලාය. ලීගය පක්ෂයක් බවට පත් කිරීමේ කටයුතු හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශාඛාවන් සමඟ සමීපතම සහයෝගිතාවයකින් ආරම්භ කර වර්ධනය කලේ ය. එම ජාත්‍යන්තර ක්‍රියාවලිය ම ජාත්‍යන්තර කමිටුව වැඩ කල අනෙකුත් රටවල ද ක්‍රියාවට නැගීම ආරම්භ විය. ලීගය දේශපාලන පක්ෂයක් බවට පරිවර්තනය කිරීම තීන්දු කලේ ආසන්න වෛෂයික කොන්දේසිවල මූලික ස්වභාවයේ වෙනස්කම් මගින් පමනක් නොව ජාක එහි ක්‍රියාකාරකම් පවත්වාගෙන ගිය ඓතිහාසික සන්දර්භයෙන් ද ය. ව'කර්ස් ලීගය හා ජාත්‍යන්තර කමිටුව සිය නිගමනයට එලඹුනේ, කම්කරු පන්තියේ පැරනි මහජන සංවිධාන අපකීර්තියට පත්ව බිඳවැටීමේ මූලයන් පැවතුනේ පශ්චාත් දෙවන ලෝක යුද්ධ සමතුලිතය තුල බවත්, එය කම්කරු පන්තියේ ජාත්‍යන්තර පරිමානයක යලි එකමුතුවීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන බවත් විනිශ්චය කිරීමෙනි.□

ලෝක ධනවාදයේ ප්‍රතිවිරෝධතා වැඩී යාම හා පන්ති අරගලය වෛෂයික ඓතිහාසික ක්‍රියාවලියක් ලෙස පැවතීමේ තතු තුල අපගේ වැඩ කටයුතුවල සංවිධානාත්මක ආකෘතීන් තීන්දු කරනු ලබයි. මෙම ආකෘතීන් හා ඉන් ප්‍රකාශ කෙරෙන කම්කරු පන්තියට ඒවායේ ඇති සම්බන්ධය, ඒවා මතුවී වර්ධනය වූ ඓතිහාසික කොන්දේසි සමග සුවිශේෂී සම්බන්ධයක් දරයි. 1959 බ්‍රිතාන්‍ය සෝෂලිස්ට් ලේබර් ලීගය, 1966 ව'කර්ස් ලීගය, 1971 බුන්ඩ් සෝෂලිස්ට්ටිෂේ, 1972 ඕස්ට්‍රේලියාවේ සෝෂලිස්ට් ලේබර් ලීගය පිහිටුවීම, කම්කරු පන්තියේ විප්ලවවාදී ව්‍යාපාරයේ වර්ධනය පිලිබඳව නිශ්චිත ඓතිහාසික කොන්දේසි හා මූලෝපායික සංකල්ප සමඟ බැඳී තිබුනි. □

හජාජාක වර්ධනය සිදුවූ මුල් වකවානුවේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය පොරබැදූ ප්‍රධාන මූලෝපායික ගැටලුව, කම්කරු පන්තියේ වඩාත්ම දියුනු කොටස් ස්ටැලින්වාදී හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී මහජන පක්ෂවලට සහ වෘත්තීය සමිතිවලට දුන් ක්‍රියාකාරී හා සටන්කාමී සහයෝගයයි. □

එබැවින් අපගේ ශාඛාවන්හි වැඩ කටයුතු උපායාත්මක වෙනස්වීම් සහිතව ම සිදුවූයේ, ඉහත සංවිධානවල පසුපෙලෙහි වඩාත්ම පන්ති විඥානයෙන් යුත් හා දේශපාලනිකව ක්‍රියාකාරී කොටස් අතර පෙරලිකාරිත්වයේ රූපයෙන් කම්කරු පන්තියේ නව මහා විප්ලවකාරී දිශානතියක් ආරම්භක ලක්ෂ්‍යය කර ගෙනය. එම ව්‍යාපාරයෙන් පිටත දී, ස්ටැලින්වාදයේ හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ වඩාත්ම අශමනීය විරුද්ධවාදීන් ලෙස ජාත්‍යන්තර කමිටුවේ ශාඛාවන් ඉටු කල උත්ප්‍රේරක ක්‍රියා කලාපය, මහජන විප්ලවවාදී පක්ෂය ගොඩනැගීම සඳහා සබෑ ඉඩ ප්‍රස්ථාවන් විවර කරනු ඇත. [147]

241. සසප පිහිටුවීමේ දී මාක්ස්වාදී ව්‍යාපාරය හා කම්කරු පන්තිය අතර සම්බන්ධයේ වෙනසක් පූර්වාපේක්ෂා කරන ලදී. □

අප ඒඑෆ්එල්-සීඅයිඕ බිඳවැටීමෙන් නිශ්චිත නිගමනවලට එලඹිය යුතු අතර පක්ෂ කර්තව්‍යයන් නිවැරදිව සූත්‍රගත කල යුතුය. කම්කරු පන්තියට

නායකත්වයක් දිය යුතු නම් එය දිය යුත්තේ අප පක්ෂය විසිනි. වැඩකරන ජන සමූහයන් සඳහා නව මාවතක් විවෘත කල යුතු නම් එය විවර කල යුත්තේ අප සංවිධානය විසිනි. නායකත්වය පිලිබඳ ගැටලුව දක්ෂ උපායක පදනම මත විසඳිය නොහැක. කම්කරු පන්තියේ නායකත්වය පිලිබඳ අර්බුදය එම නායකත්වය 'වෙනත් අය විසින් දිය යුතු යයි' ඉල්ලා සිටීමෙන් අපට විසඳිය නොහැකිය. නව පක්ෂයක් තිබිය යුතු නම් අප එය ගොඩනැඟිය යුතුය. [148]

## සමානතාවයේ වැදගත්කම

242. සමාජවාදී සමානතා පක්ෂයේ නම තෝරා ගැනීම වූ කලී, අව්‍යාජ මානව සමානතාවයේ මල්පල ගැනීම වන සමාජවාදයේ අත්‍යාවශ්‍ය දෘෂ්ටිය පිලිබඳ සංකල්පයත්, නූතන යුගයේ ධනේශ්වර කොන්දේසි කෙරහි අශමනීය විප්ලවවාදී විරුද්ධත්වයත් පිලිබඳ ආකල්පයකි. සමාජවාදී සමානතා පක්ෂය ගොඩනැඟීම සඳහා කැඳවුම් කරමින් නෝර්ත් මෙසේ සඳහන් කලේය:

වෛෂයික කොන්දේසි යොමුව ඇත්තේ විප්ලවයේ දිශාවටයි. අප ඉතිහාසයේ දන්නා පරිදි විප්ලවවාදී විඥානයේ වර්ධනය ස්වයංක්‍රීය ක්‍රියාවලියක් නො වේ. ධනවාදයේ සැඟවුනු ප්‍රතිවිරෝධයන් මඟින් උත්පාදනය කරන ආවේශයන් සමාජවාදී චින්තනයේ රූපයන් බවට එමඟින් ම පරිවර්තනය නො වේ. දී ඇති වෛෂයික තත්වයක් කෙරේ කම්කරු පන්තියේ ප්‍රතිචාරය, වෛෂයිකව දී ඇති ඉමහත් ඓතිහාසික සංකීර්නතාවන් සමඟ බැඳී ඇත. මෙය සැබවින්ම රටින් රටට වෙනස්විය හැකිය. එහෙත් සෑම අවස්ථාවකදී ම මාක්ස්වාදීන්, සිතුවිලි කරා මඟ, මම එයට කම්කරු පන්තියේ හදවත් යන්න ද එකතු කරමි, සොයාගත යුතුය.

> ලීගය පක්ෂයක් බවට පරිවර්තනය කිරීමේ දී අප, පුලුල් වැඩ කරන ජනතාව සම්බන්ධයෙන් ධනවාදී පද්ධතිය විසින් ම නිරාවරනය කරන අර්බුදයේ රූපය ගැන සැලකිලිමත් විය යුතුය. සරලව කිවහොත් මිලියන ගනන් වැඩ කරන ජනතාව සිය ජීවන තත්වයන්ගේ ඇතිවෙමින් තිබෙන දිග් ගැස්සුනු පරිහානිය අත්විඳ තිබේ. ඔවුන් සිය ජීවිත ගෙවා ඇත්තේ තම රැකියා පිලිබඳ සදාකාලික බියකින් ද, මිල ඉහල නගිද්දී වැටුප් පහල වැටීම හමුවේ දෙකොන ගැටගසා ගැනීමේ අරගලයක ද යෙදෙමිනි.
>
> ඇමරිකානු ජීවිතයේ ප්‍රමුඛ ලක්ෂනය වන්නේ ජනගහනයේ සුලු ප්‍රතිශතයක් පෙර නොවූ විරූ ධන සම්පත් භුක්ති විඳීමත් වැඩ කරන ජනතාවගේ පුලුල් බහුතරය විවිධ ප්‍රමානයේ ආර්ථික අවිනිශ්චිත භාවයෙන් හා ආපදාවට පත්ව දිවි ගෙවීමත්ය.
>
> කම්කරු පන්තියේ ආර්ථික තත්වයේ හා සමාජ කොන්දේසිවල පරිහානිය තව දුරටත් නරක අතට හරවමින් එයට තෙල් වත්කල තාක්ෂනික විප්ලවයත්, නිෂ්පාදනයේ භූගෝලීයකරනයත් කෙලින් ම ඊට සම්බන්ධය. නිෂ්පාන බලවේගයන්ගේ පෞද්ගලික අයිතියේ තන්ත්‍රය යටතේ කම්කරු පන්තිය, තාක්ෂනය විසින් සිය ග්‍රහනයට ගත්තේය.
>
> අපගේ පක්ෂයේ නමින් ම පෙන්වන ආකාරයටත් කම්කරුවන්ට හඳුනාගෙන අනන්‍ය වියහැකි ආකාරයටත් එහි අරමුන වනු ඇත්තේ...
>
> කෙටියෙන්, මෙම පක්ෂය කම්කරු පන්තියට හඳුන්වාදීමේ දී, එහි අරමුන කම්කරුවන්ගේ ආන්ඩුවක් ගෙඩනැඟීමයි යන්නෙන් අප අදහස් කරන්නේ, කම්කරුවන් සඳහා, කම්කරුවන්ගේ, කම්කරුවන් විසින් පාලනය කරන යන්නයි. එවන් ආන්ඩුවක්, සමාජමය වශයෙන් ව්‍යසනකාරී ධනේශ්වර වෙලඳපොල බලවේග ජය ගෙන ඒ වෙනුවට කම්කරු පන්තියේ අවශ්‍යතා සඳහා ආර්ථික ජීවිතය හැකි නම් ප්‍රජාතන්ත්‍රවාදී මාධ්‍යයන් තුලින් ප්‍රතිසංවිධානය කිරීමට බලාපොරොත්තු වෙයි. කම්කරු පන්තියේ ක්ෂනික සමාජ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා නිෂ්පාදනයේ රැඩිකල් ප්‍රතිසංවිධානයක් ක්‍රියාවට නැංවීමටත්, කම්කරු ජනතාවගේ ශුභ සෙත වෙනුවෙන් ධනය සමාජීයව සාධාරන යලි බෙදාහැරීමකටත් එමඟින් සමාජවාදය සඳහා පදනම දැමීමටත් බලාපොරොත්තු වේ.
>
> සමාජවාදී සමානතා පක්ෂයේ මෙම අරමුනු සාක්ෂාත් කර ගත හැක්කේ, කම්කරු පන්තියේ සවිඥානක ව්‍යාපාරයක කොටසක් ලෙස, ඒ සමඟ ඇතිකරගන්නා සන්ධානයකින් පමනක් බව අපි අවධාරනය කල යුත්තෙමු. ඇමරිකානු කම්කරුවෙකුට, සිය පන්ති සහෝදරයන් හා සහෝදරියන් අනෙකුත් රටවල දී බහුජාතික හා අන්තර්ජාතික සංගතයන් විසින් සූරාකන හා පීඩාවට පත් කරන තාක් දුරට, සමාජ සමානතාවය හා සමාජ යුක්තිය නොලැබෙනු ඇත. තවද, පන්ති අරගලය පදනම් කල හැකි ජාතික ක්‍රමෝපායක් ද ඇත්තේ නැත. කම්කරු පන්තිය, අන්තර්ජාතික සංගතවල ජාත්‍යන්තර මූලෝපායට සිය ජාත්‍යන්තර මූලෝපාය නිරන්තරයෙන් හා ක්‍රමානුකූලව හරස් කල යුතුය. සමාජවාදී

ක්‍රියාමාර්ගයේ පිහි තුඩ වන මෙම අත්‍යවශ්‍ය ප්‍රශ්නය මත කිසිදු සම්මුතියක් තිබිය නොහැකිය...

...සමාජ සමානතාවය සඳහා ඉල්ලීම, සමාජවාදී ව්‍යාපාරයේ මූලික අරමුන සම්පින්න්ඩනය කරනවා පමනක් නොව, ඇමරිකන් කම්කරුවන්ගේ අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී හා විප්ලවවාදී සම්ප්‍රදායන් තුල ගැඹුරට මුල්බැස ඇති සමාන අවස්ථා පිලිබඳ මතකය ද අවධි කරයි. ඇමරිකානු ඉතිහාසයේ සෑම මහා සමාජ අරගලයක ම ධජයන් මත සමාජ සමානතාවය සඳහා වන ඉල්ලීම කොටා තිබේ. දේශපාලන ප්‍රතිගාමීත්වයේ පවත්නා වාතාවරනය තුල මෙම සංකල්පය අනවරත ප්‍රහාරයකට ලක්ව තිබීම අහම්බයක් නො වේ. [149]

## *ලෝක සමාජවාදී වෙබ් අඩවිය*

243. 1998 ජනවාරියේ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ස්ථාපිත කිරීම, ජාත්‍යන්තර කමිටුවේ හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ ඉතිහාසයෙහි සැතපුම් කනුවක් සලකුනු කරයි. මෙය, 1985-86 කම්කරු විප්ලවවාදී පක්ෂය සමග භේද වීමෙන් පසුව, ජාත්‍යන්තර කමිටුව දේශපාලනිකව ඒකාබද්ධ ලෝක පක්ෂයක් ලෙස වර්ධනය කිරීමේ ප්‍රතිපලයයි. තවද, *ලෝසවෙඅ* යටින් පැවති සංකල්පය, මාක්ස්වාදී පදනම් මත දේශපාලනිකව යලි කම්කරු පන්තිය වෙත යොමුවීමේ දී, ජාත්‍යන්තර කමිටුව තීරනාත්මක ක්‍රියා කලාපයක් ඉටු කරනු ඇති බවය. මෙම සංකල්පය උකහා ගනු ලැබුවේ ලීගයන් පක්ෂ බවට පරිවර්තනය කිරීමට උත්තේජනය ලබා දුන් ඉදිරිදර්ශනයෙනි. *ලෝසවෙඅ* දියත්කිරීමේ තාක්ෂනික පූර්ව කොන්දේසි, භූගෝලීයකරනය පිලිබඳ සිය විශ්ලේෂනයේ කොටසක් ලෙස ජාක ප්‍රවේශමෙන් නිරීක්ෂනය කර තිබුනු තොරතුරු තාක්ෂනයේ විප්ලවකාරී ජයග්‍රහනයන්ගේ රූපයෙන් ලඟාවිය. ව්‍යාපාරයේ විවිධ ශාඛාවන් පොදු සහයෝගී වැඩ කටයුතුවල දී ඒකාබද්ධ කර ගැනීමේ (මෙයට සාගර හා මහාද්වීප හරහා ලිපිගොනු හුවමාරු කර ගැනීමේ දී දත්ත සම්ප්‍රේෂන උපකරන (මෝඩම්) යොදාගැනීම ද ඇතුලත්ය.) ක්‍රම පිලිබඳව ජාක සොයා බලමින් සිටියේය. අන්තර් ජාලයේ වැදගත්කමට එය ඉහලින් ම අනුරූපි විය. ගෝලීය පනිවිඩ හුවමාරුවේ මෙම විප්ලවකාරී සොයාගැනීම්, විප්ලවවාදී වැඩ කටයුතු සංවිධානය කිරීමේදීත්, විප්ලවකාරී අදහස් ප්‍රචලිත කිරීමේදීත් හිතකර කොන්දේසි නිර්මානය කලේය. බොහෝ දශක ගනනක් තිස්සේ පුවත් පත් නිෂ්පාදනය කිරීම විප්ලවවාදී ව්‍යාපාරය ගොඩනැගීමේ දී ප්‍රමුඛ හා තීරනාත්මක ක්‍රියා කලාපයක් ඉටුකර තිබේ. සමස්ත රුසියානු පුවත් පතක ක්‍රියා කලාපය පැහැදිලි කිරීම සඳහා ලෙනින්, කල යුත්තේ කුමක්ද? වැනි සිය ප්‍රභවාත්මක වැඩවලින් සැලකිය යුතු කොටසක් කැපකර තිබේ. 1966 ව'කර්ස් ලීගය පිහිටවූ තැන් පටන් පුවත් පතක් පලකොට තිබේ. එහෙත් එහි අලෙවිය රඳා පැවතුනේ, එහි බෙදාහැරීම සංවිධානය කිරීම සඳහා නියමිත ඕනෑම ස්ථානයක දී ඊට කායිකව සම්බන්ධ වන පක්ෂ සාමාජිකයන් සංඛ්‍යාව මතය. සිය අදහස් ප්‍රචාරය කිරීමේ මාධ්‍යයක් ලෙස පුවත් පතට පිලිගත හැකි විකල්පයක් නොපැවති තාක් කල් හා ව'කර්ස් ලීගයට ද ජාක විවිධ ශාඛාවන්ට ද ඔවුන්ට හැකිතාක් කල් මෙම සීමාවන්ට මුහුන පෑමට සිදුවිය. අන්තර් ජාලයේ වර්ධනය පැරනි සීමාසහිතකම් ජයගැනීමටත් සසප හා ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රාවකත්වය විශාල ලෙස පුලුල්කර ගැනීමටත් නව කොන්දේසි නිර්මානය කලේය.

244. වෙබ් අඩවිය හුදු තාක්ෂනික වර්ධනයේ නිමැවුමක් නොවීය. එය පදනම් වූයේ ලෝක මාක්ස්වාදී ව්‍යාපාරයේ සමුච්චිත න්‍යායික ප්‍රාග්ධනය මතය. වෙබ් අඩවිය දියත් කිරීම මුල්කොට ගෙන කර්තෘ මන්ඩලය මෙම කරුනු පැහැදිලි කලේය.

ආසියාවේ, ඕස්ට්‍රේලියාවේ, යුරෝපයේ හා උතුරු ඇමරිකාවේ සාමාජිකයන්ගෙන් සැදුම්ලත් හජාජාක විසින් ප්‍රකාශයට පත්කල *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* එහි ආරම්භක ලක්ෂ්‍යය ලෙස ගත්තේ පන්ති අරගලයේ ජාත්‍යන්තර ස්වභාවයයි. සෑම රටකම දේශපාලන වර්ධනයන් කරා එය පිවිසුනේ ධනවාදයේ ලෝක අර්බුදයේ හා ජාත්‍යන්තර කම්කරු පන්තිය මුහුනපාන දේශපාලන කර්තව්‍යයන්ගේ දෘෂ්ටි ආස්ථානයේ සිටය. මෙම ඉදිරිදර්ශනයෙන් ගලාඑන පරිදි එය සියලු වර්ගයේ ස්වෝත්තමවාදයන්ටත් ජාතික සීමාසහිතකම් වලටත් අධිෂ්ඨානශීලී ලෙස විරුද්ධ වෙයි.

කම්කරු පන්තියේ ජාත්‍යන්තර පරිමාන එකමුතුව හා දේශපාලන අධ්‍යාපනය සඳහා *ලෝසවෙඅ* පෙර නොවූ විරූ උපකරනයක් බවට පත්වනු ඇතැයි අපට විශ්වාසය. අන්තර් ජාතික සංගත ජාතික දේශසීමා හරහා ශ්‍රමයට එරෙහිව ඔවුන්ගේ යුද්ධය සංවිධානය කරන ආකාරයට ම විවිධ රටවල වැඩ කරන ජනතාවගේ අරගල සම්බන්ධීකරනයට එය උපස්ථම්භක වනු ඇත. එය සියලු ජාතීන්ගේ කම්කරුවන් අතර සාකච්ඡාවට පහසුකම් සලසන අතර සිය අත්දැකීම් සසඳ බැලීමටත් පොදු මූලෝපායක් විස්ථාරනය කර ගැනීමටත් ඉඩ සලසයි.

අන්තර් ජාලය ප්‍රසාරනය වීමත් සමග ලෝක සමාජවාදී වෙබ් අඩවිය සඳහා ද ලෝක ප්‍රේක්ෂකත්වයක් ගොඩනැගෙනු ඇතැයි ජාක බලාපොරොත්තු වෙයි. සන්නිවේදනයේ වේගවත් හා ගෝලීය රූපාකාරයක් ලෙස අන්තර්ජාලය, අසාමාන්‍ය ප්‍රජාතන්ත්‍රවාදී හා විප්ලවවාදී ඇඟවුම් ගැබ්කර ගනියි. එය විශාල ප්‍රේක්ෂකයන් සංඛ්‍යාවකට පුස්තකාල, ලේඛනාගාර හා කෞතුකාගාර තුලින් ලෝකයේ බුද්ධිමය සම්පත් කරා පිවිසීමේ හැකියාව ලබාදෙයි.

15 වන සියවසේ ගුටෙන්බර්ග්ගේ මුද්‍රනාලය සොයා ගැනීම, බුද්ධිමය ජීවිතය මත පල්லියේ පාලනය බිඳ දැමීමේ තීරනාත්මක ක්‍රියා කලාපයක් ඉටු කලේ, වැඩවසම් ආයතනවලට වලකපමින් ද පුනරුදයෙන් ආරම්භවී පුනර්ජීවනය හා ප්‍රන්ස විප්ලවය තුල ප්‍රකාශයට පත්වූ මහා සංස්කෘතික පිබිදීම පෝෂනය කලේය. එසේ ම අද දින විප්ලවවාදී චින්තනයේ පිබිදීමක් ඇතිකිරීමේ දී අන්තර් ජාලයට ඒ සඳහා දායක විය හැකිය. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව, ලෝකය පුරා වැඩ කරන හා පීඩිත ජනතාවගේ විමුක්තිය සඳහා මෙම තාක්ෂනය උපකරනයක් ලෙස යොදා ගැනීමට බලාපොරොත්තු වෙයි. [150]□

ලෝසවෙඅ ප්‍රකාශයට පත්කර පලමු දශකය තුල දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික හා ඓතිහාසික කරුනුවල පුලුල් පරාසයක් ආවරනය කල ලිපි 20,000 කට අධික සංඛ්‍යාවක් පලකලේය. මෙවන් පරිමානයකින් වැඩ කිරීමට හැකි වූයේ දශක ගනනාවක් පුරා ජාක රැස්කරගෙන තිබූ ඓතිහාසික අත්දැකීමේ දැවැන්ත ප්‍රාග්ධනය නිසා ය. තවද සම්භාව්‍ය මාක්ස්වාදයේ සම්ප්‍රදායන් තුල මුල්බැසගත් එහි න්‍යායික කටයුතු, හුදෙක් සිදුවීම් අර්ථ දැක්වීමේ නාමයෙන් පමනක් නොව, විප්ලවවාදී අරගලයට කම්කරු පන්තිය සූදානම් කිරීමේ එල්ලය ද ඇතිව, ආත්මීය සවිඥානකත්වය වෛෂයික යථාර්තය සමග වඩාත් නිශ්චිත හා නිවැරදි ආකාරයකට පෙල ගස්වන, අපෝහකවාදී හා ඓතිහාසික භෞතිකවාදී පදනමක පිහිටුවා ගැනීමට පොර වැදුනේය.□

## මිලිටරි වාදයේ පුපුරායාම හා ඇමරිකානු සමාජයේ අර්බුදය

245. ඇමරිකානු හා ලෝක අධිරාජ්‍යවාදයේ දිග හැරෙමින් ඇති අර්බුදය පිලිබඳ සිය විශ්ලේෂනයේ දී ලෝසවෙඅ පෙන්නුම් කල හෙලිදරව්කාරී හා දූරදර්ශී මට්ටම අන් කිසිදු ප්‍රකාශනයක දක්නට නොලැබුනි. ලෝක සමාජවාදී වෙබ් අඩවිය ඉදිරිපත් කල විශ්ලේෂනයේ සුවිශේෂත්වය නම් එහි ඓතිහාසික ස්වභාවය, සිදුවීම් පුලුල් සන්දර්භයක පිහිටුවීමෙහි ලා එයට පැවති හැකියාව හා සිදුවීම් විනිවිද දැකීමටත්, සිදුවීම්වල මතුපිට දෘෂ්‍යමානයට ඔබ්බෙන් දැකීමටත් එයට හැකිවීමය. ඇමරිකානු මිලිටරි බලයේ මිනීමරු සංදර්ශන මධ්‍යයේ, සමස්ත අධිරාජ්‍යවාදී පර්යායේ අත්තිවාරම් බාදනය වීමේ ප්‍රතිවිරෝධයන් සසප හඳුනා ගත්තේය. එක්සත් ජනපදය යලි යලිත් මිලිටරි බලය යොදාගැනීම දුබලකමේ සලකුනක් යයි එය අවධාරනය කලේය. □

එක්සත් ජනපදය වර්තමානයේ දී ආයුධ කර්මාන්තය තුල "තරගකාරී වාසියක්" අත්විඳියි. එහෙත් මෙම වාසිය හෝ මෙම කර්මාන්තයේ නිෂ්පාදනවලට හෝ ලෝක ආධිපත්‍ය සහතික කල නොහැකිය. එය සතු ආයුධවල නවීනත්වය තිබිය දී ම එක්සත් ජනපදයේ මූල්‍ය-කාර්මික පදනම, 50 වසරකට පෙර තිබුන තරම් ලෝක ධනවාදයේ කටයුතු සම්බන්ධයෙන් ගත්කල එහි අධිපති ක්‍රියාකලාපයට අද සැහෙන්නේ නැත. ලෝක නිෂ්පාදනයේ එහි පංගුව නාටකාකාර ලෙස පහත වැටී තිබේ. එහි ජාත්‍යන්තර වෙලඳ හිඟය සෑම මසකම ඩොලර් බිලියන ගනන්වලින් ඉහල නගියි. නිවැරදි ඉලක්කය සොයා යන යුධෝපකරන පිලිබඳ කල්ලියේ යටි සංකල්පය වන යුධායුධ තාක්ෂනයේ හී තුඩෙහි ප්‍රමුඛයන් වීමෙන් ජාතික ශක්තියේ මෙම අති මූලික ආර්ථික දර්ශක අභිබවා යා හැකිය යන්න අන්තරායකාරී මුලාවකි.

සැබවින්ම, යුධායුධ තාක්ෂනයේ " ඓශ්වර්යයන්" සමග ඇති මෙම ඇගැලුම් කම ද, ඒවායින් පොරොන්දුවන "ප්‍රාතිහාර්යයන්" ද ඔවුන් එය දැන හෝ නොදැන සිටියත්, ඓතිහාසික මල අන්තයකට පැමින සිටින පාලක පැලැන්තින් අතර බොහෝ පොදු දෙයකි. ජාත්‍යන්තර හා දේශීය සමාජ ආර්ථික ප්‍රතිවිරෝධයන්ගේ සංකීර්න පෙලගැස්ම මගින් සිහි විකල් වූ, ඒවා තේරුම් ගැනීමට නොසමත් හා ඒවාට සම්ප්‍රදායික විසඳුම් නොමැති අය, අවි ආයුධ හා යුද්ධය දැකගන්නේ මේ ගැටලු හරහා බිඳගෙන යාහැකි මාධ්‍යයන් ලෙසය. [151]
□

246. සසප ඉදිරිපත් කල විශ්ලේෂනය තුල අධිරාජ්‍යවාදී ප්‍රචන්ඩත්වයේ හිස එසවීම, ඇමරිකානු

සමාජයේ ගැඹුරුවන සමාජ ප්‍රතිවිරෝධතාවලට සම්බන්ධ කලේය.

ධනේශ්වර පාලක පැලැන්තියට අතුලත්වන වරප්‍රසාදිත කොටසත් පලල් වැඩකරන ජන සමූහයනුත් අතර ගැඹුරුවන ආගාධය ඇඟවුම් කරන්නේ සමාජ හා පන්ති ආතතීන්ගේ වෛෂයික ඉහල මට්ටමයි. මෙම තක්සේරුව, එක්සත් ජනපදය තුල සටන්කාමී කම්කරු ක්‍රියාකාරිත්වයක අඩුව මඟින් ප්‍රශ්නයට භාජනය කලහැකි බවක් පෙනී යයි. එහෙත් වැඩ වර්ජන හා අනෙකුත් ජනතා සමාජ විරෝධතාවන්ගේ පහල මට්ටම සමාජ ස්ථාවරත්වය ඇඟවුම් නොකරයි. ඒ වෙනුවට වේගයෙන් වැඩෙන සමාජ අසමානතාවය මධ්‍යයේ ම පසුගිය දශකයේ පන්ති ගැටුම එතරම් පහත් මට්ටමක ප්‍රකාශිත වීමේ කාරනය ඉගි කරන්නේ එක්සත් ජනපදයේ පවත්නා දේශපාලන හා සමාජ ආයතන කම්කරු පන්තියේ සමුච්ජය වන නොසංසුන්තාවය කෙරෙහි ප්‍රතිචාර නොදක්වන බවයි. වෘත්තීය සමිති වැනි ස්ථාපිත සමාජ සංවිධාන තවදුරටත් මහජන දුක් ගැනවිලි සඳහා පෙනී සිටින නාලිකාවන් ලෙස සීමිත ආකාරකට වත් ක්‍රියා නොකරති. දැන් කම්කරු පන්තියට අවශ්‍ය වන්නේ සිය මූලෝපාය, ක්‍රියාමාර්ගය හා ඉදිරිදර්ශනය ලෝක ආර්ථිකයේ වෛෂයික ප්‍රවනතාවන්ට හා ඓතිහාසික වර්ධනයට අනුකූල වන්නාවූ නව විප්ලවවාදී හා ජාත්‍යන්තර සංවිධානයකි.

එවන් ජාත්‍යන්තර විප්ලවවාදී සංවිධානයක් ගොඩනැගීමේ කිසිදු හැකියාවක් ඇතැයි නොසිතන අශුභවාදීන් විශාල කන්ඩායමක් සිටින බව අපි හොඳකාරව ම දන්නෙමු. මෙම අශුභවාදීන්ගෙන් වඩාත්ම ඇටුවන් බැහැපු කොටස දැකිය හැක්කේ හරියට ම මේ මෑතක් වන තෙක්ම, සෝසසසං සදාකාලික බව ගැඹුරින්ම විශ්වාස කල හා වෘත්තීය සමිති කෙරෙහි පූර්න විශ්වාසය තබා සිටියවුන් අතර බව යමෙක් සැලකිල්ලට ගත යුතුය. නිලධාරිවාදී ලෙස පරිපාලිත ප්‍රතිසංස්කරන සදාකාලික බව ඊයේ වන තෙක්ම ඔවුහු විශ්වාස කලහ. ඊට නොඅඩු ඒත්තු ගැනීමක් සහිතව ඔවුන් අද විශ්වාස කරන්නේ ධනවාදී ප්‍රතිගාමිත්වයේ ජයග්‍රහනය සදාතනික බවය. ඊයේ මත්වූ ශුභවාදයත් අද දිනයේ බෙලසුන් අශුභවාදයත් නිශ්චිත වර්ගයක බුද්ධිමය හරසුන් භාවයක් පෙන්නුම් කරයි. ඔවුන්ගේ කැපී පෙනෙන ගති ලක්ෂන නම් අත්‍යවශ්‍ය ඓතිහාසික රාමුවක් තුල බහා සිදුවීම් විභාගකර බැලීමේ නොකැමැත්ත හා නොහැකියාවත්, සමාජ ස්ථාවරත්වයේ බෙහෙවින් නොමඟ යවන සුලු මතුපිට දෘෂ්‍යමානයට යටින් ඇති ප්‍රතිවිරෝධයන් පිරික්සා බැලීමට මැලිකමක් දැක්වීමත් ය.

කම්කරු පන්තියේ විප්ලවවාදී ක්‍රියා කලාපය පිලිබඳ විශ්වාසයත්, සමාජවාදයේ වෛෂයික ශක්‍යතාවත් විශ්වාසය පිලිබඳ කාරනාවක් නො වේ. එය ධනේශ්වර සංවර්ධනයේ හා ඉතිහාසයේ, විශේෂයෙන් 20 වන සියවසේ ඉතිහාසය පිලිබඳ න්‍යායික අභිනිවේෂය පිලිබඳ කාරනයකි, [152] □

247. පසුකාලීන වර්ධනයන්, විශේෂයෙන් 2001 සැප්තැම්බර් 11 දින අභව්‍ය හා නොපැහැදිලි සිදුවීමුත්, ඇමරිකානු මිලිටරිවාදයේ ගෝලීය පුපුරා හැලීමත් සසප අනතුරු ඇඟවීම් සනාථ කලේය. 2001 ඇෆ්ගනිස්ථාන ආක්‍රමනය හෝ 2003 මාර්තු ඉරාක ආක්‍රමනය ලෝක සමාජවාදී වෙබ් අඩවිය පුදුමයට පත්කලේ නැත. එහි විශ්ලේෂනය කාලයේ පරීක්ෂනයට ඉඩ හලේය. ඉරාක ආක්‍රමනයෙන් පැය 24 ක් ඇතුලත සසප, ආක්‍රමනයෙන් ඇතිකල හැකි ප්‍රතිවිපාක පෙර දුටුවේය. □

20 වන සියවස නිෂ්ඵල ලෙස ගෙවීගියේ නැත. එහි ජයග්‍රහනයන් ද ඛේදාන්තයන් ද කම්කරු පන්තියට නොමිනිය හැකි දේශපාලන පාඩම් දායාද කොට දුන්නේය. ඒ අතර වඩාත්ම වැදගත් වන්නේ අධිරාජ්‍යවාදී යුද්ධයේ වැදගත්කම හා ඇඟවුම් පිලිබඳ අවබෝධයයි. සියල්ලටත් වඩා එය ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිවිරෝධයන්ට " සාමාන්‍ය'' නාලිකා තුලින් විසඳුම් සොයාගත නොහැකිය යන්නට වැඩි දෙයකි. ආරම්භවී ඇති ගැටුමේ ආරම්භක අදියරයන්හි ප්‍රතිපලය කුමක් වුවත් ඇමරිකානු අධිරාජ්‍යවාදය මුහුන දී ඇත්තේ ව්‍යසනයකටය ය. එයට ලෝකය ජයගත නොහැකි ය. එයට මැදපෙරදිග ජනතාවන් මත විජිතවාදී දඬුඅඬුව යලි ඇටවිය නොහැකිය. යුද්ධයේ මාධ්‍ය තුලින් එය තම අභ්‍යන්තර ව්‍යාධීන්ට පිලිගතහැකි විසඳුමක් සොයා නොගනු ඇත. ඒ වෙනුවට පෙර නොදුටු විරූ ආකාරයේ දූෂ්කරතා ද යුද්ධය මඟින් එල්ල කෙරෙන වඳවී යාමේ තර්ජනය කෙරෙහි නැඟෙන විරෝධය ද ඇමරිකානු සමාජයේ සියලු අභ්‍යන්තර ප්‍රතිවිරෝධයන් උත්සන්න කෙරෙනු ඇත. [153] □

# ධනවාදයේ ලෝක අර්බුදය හා සමාජවාදී සමානතා පක්ෂයේ කර්තව්‍යයෝ

248. ඇමරිකානු ධනවාදයේ අර්බුදය වනාහි ලෝක ධනේශ්වර පද්ධතියේ පොදු අර්බුදයේ එක් ප්‍රකාශනයක් පමනි. *ලෝසවෙඅ* මෙම ක්‍රියාවලිය විස්තරාත්මකව විශ්ලේෂනය කර තිබේ. 1997 ජූලියේ ඊනියා ආසියානු මූල්‍ය අර්බුදය පුපුරා යාමත්, එක්සත් ජනපදයේ ඩොට්කොම් බුබුල බිඳවැටීමත්, ගෝලීය මූල්‍ය පද්ධතියක් නිර්මානය කිරීමෙන් හා ඇමරිකානු ආර්ථිකයේ එන්ට එන්ටම වැඩිවන මූල්‍යකරනයෙන් නැගි ආ පුපුරන සුලු ප්‍රතිවිරෝධයන් හෙලිදරව් කලේය. 2000 වසරේ ජනවාරියේ දී සිඩ්නි නුවර පැවති ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂ සමුලුවට එහි ජාතික ලේකම් නික් බීම්ස් ඉදිරිපත් කල වාර්තාවේ මෙසේ සඳහන් විය.

> පසුගිය දශකය පුරා ගෝලීය මූල්‍ය වෙලඳපොලවල ගැඹුරුවන අර්බුදයන් මාලාවක් අප දැක තිබේ. 1990 ගනන් මුල, විරැකියා මට්ටම් පහත වැටී ඇති බවට පලවූ කියාපෑම් මධ්‍යයේ නොඅඩුව ඉදිරියට ගිය සංගතවල රැකියා විනාශයේ අවධියක් ඇරඹුනු, පලමු පසුබෑම දැකිය හැකි විය. 1992 දී අප දැක්කේ බ්‍රිතාන්‍ය පවුමේ අර්බුදයත්, යුරෝපීය විනිමය අනුපාත යාන්ත්‍රනයේ හා ස්කැන්ඩිනේවියානු බැංකු පද්ධතියේ අර්බුදයත් ය. 1994 බැඳුම්කර වෙලඳපොලේ අර්බුදය පසුපසින් එක්සත් ජනපද බැංකු වෙනුවෙන් ක්ලින්ටන් පරිපාලනය විසින් සංවිධානය කල ඩොලර් බිලියන 50 ක හදිසි ඇපදීමක් හා බැඳුනු මෙක්සිකානු අර්බුදය පැමිනියේය. මෙක්සිකානු අර්බුදය "විසඳනු" ලැබූ බව කියා වැඩිකල් යන්නට මත්තෙන් 1997-98 හටගත් ඊනියා ආසියානු මූල්‍ය අර්බුදය රුසියානු නය පැහැර හැරීමකටත් 1998 සැප්තැම්බරයේ එක්සත් ජනපදයේ දිගුකාලීන ප්‍රාග්ධන කලමනාකරන ආරක්ෂිත අරමුදල බංකොලොත් බවට පත්වීමටත්, එක්සත් ජනපදයේ හා ජාත්‍යන්තර මූල්‍ය ක්‍රමයේ පද්ධතිමය අර්බුදයක තර්ජනය වලක්වා ගැනීමට එක්සත් ජනපද ෆෙඩරල් මහ බැංකුවේ මැදිහත්වීමකටත් තුඩු දුන්නේය. සත්තකින්ම මෙම සිදුවීම් මෙක්සිකානු අර්බුදය, ආසියානු අර්බුදය, රුසියානු පැහැරහැරීම ලෙස නම් කිරීම වැරදි ව්‍යවහාරයකි. අප අත්දකිමින් සිටින්නේ ගෝලීය මූල්‍ය අර්බුදයක වෙනස් වූ ප්‍රකාශනයන්ය. රෝගය හදවත කරා පැමිනීමට පෙර ඉදිමුම ලෙස අත්පාවලට පහර දෙන්නාක් මෙන් ගෝලීය මූල්‍ය අර්බුදය දැන් එක්සත් ජනපදයේ දිගහැරෙමින් ඇති සිද්ධීන් තුල ප්‍රකාශයට පත්වෙයි. □

249. 2000-01 පසුබෑමෙන් ඉක්බිත්තේ එක්සත් ජනපදය හා ලෝක ආර්ථිකය, පශ්චාත් යුද්ධ ආර්ථික උත්පාතයේ පටන් ගෝලීය වර්ධන අනුපාතය ලබා ගත් සමහර ඉහල ම වර්ධනයන් සමඟ ප්‍රසාරනයක් අත් දුටුවේය. එහෙත් මෙම ධනේශ්වර ඉහල නැගීම පදනම් වූයේ එන්ට එන්ට ම අස්ථාවර වන පදනම් මතය. සියල්ලටත් වඩා මෙය ප්‍රකාශ වූයේ එක්සත් ජනපද නය ඉහල යාම හා කොටස් වෙලඳපොල, ඩොට්කොම් හා දේපල බුබුලු මාලාවක් නිර්මානය කිරීම තුලය. 2007-08 මූල්‍ය අර්බුදය තුල මේ සියල්ල යලි වතාවක් විවෘත රූපයකින් පුපුරා ආවේය. 2008 ජනවාරියේ දී ඕස්ට්‍රේලියාවේ සසප ජාතික ලේකම් නික් බීම්ස් පැහැදිලි කල පරිදි □

> එක්සත් ජනපදයේ මූල්‍ය අර්බුදය ද, විශේෂයෙන්ම පසුගිය සත් වසරක කාලය තුල අඩු දියුනු රටවල ප්‍රගතිය හා බැඳුනු ලෝක ආර්ථික වර්ධනයේ ප්‍රසාරනය ද, වෙනම සිදුවීම් නොව එකම ක්‍රියාවලියක වෙනම පැති හා අංශයන්ය චීනයේ හා අනෙක් රටවල ද ප්‍රසාරනය එක්සත් ජනපදයේ කඳු ගැසුනු නය නොමැතිව සාක්ෂාත් නොවිය හැකිව තිබුනි. එහෙත් වත්මන් අර්බුදය හටගෙන ඇත්තේ ගෝලීය ඉල්ලුම හා එක්සත් ජනපද ආර්ථිකය පවත්වා ගැනීමට උපස්ථම්භක වූ මෙම නය උග්‍රවීමේ විපාකය ලෙස ය. ඒ සමඟ ම චීනයේ හා වෙනත් රටවල අඩු වියදම් නිෂ්පාදන හා එම ප්‍රදේශ ලෝක ආර්ථිකයට ඒකාග්‍ර වීම උද්ධමනකාරී පීඩනය අඩුකර ඇත. මෙම ක්‍රියාවලිය මගින් අඩු පොලී අනුපාතික පවත්වා ගැනීමට සාධක නිර්මානය කිරීම එක්සත් ජනපද ආර්ථිකය පමනක් නොව මුලු ලෝක ආර්ථිකයම පවත්වා ගැනීමට ප්‍රාන සම ලෙස වැදගත්වූ නය ප්‍රසාරනයට ඉන්ධන සැපයී ය. [154] □

250. සෝසසසං බිඳ වැටීමෙන් සත් වසරකට පසුව ලෝක ධනවාදය, අන් සියල්ලටත් වඩා අධිරාජ්‍යවාදයේ මධ්‍යස්ථානය වන එක්සත් ජනපදය, ආර්ථික අර්බුදයක ගිලී ඇත. 2008 වසරට එලඹුනු කල සසප වෛෂයික අර්බුදය හා පක්ෂයේ කර්තව්‍යයන් පිලිබඳ ශේෂ පත්‍රයක් සකස් කලාය. පසුගිය දශක තුන තිස්සේ අසාමාන්‍ය ලෙස වැඩීගිය සමාජ අසමානතාවය විවෘත හා ප්‍රචන්ඩ පන්ති ගැටුම්වල ලක්ෂ්‍යයක් කරා වේගයෙන් ලඟාවෙමින් තිබෙන බව එය සඳහන් කලේය. 251. සෝසසසං බිඳ වැටීමෙන් දහසය වසරකට පසුව ලෝක ධනවාදය, අන් සියල්ලටත් වඩා අධිරාජ්‍යවාදයේ මධ්‍යස්ථානය වන එක්සත් ජනපදය, ආර්ථික අර්බුදයක

ගිලී ඇත. 2008 වසරට එළඹුනු කල සසප වෛෂයික අර්බුදය හා පක්ෂයේ කර්තව්‍යයන් පිලිබඳ ශේෂ පත්‍රයක් සකස් කලාය. පසුගිය දශක තුන තිස්සේ "අසාමාන්‍ය ලෙස වැඩිගිය සමාජ අසමානතාවය විවෘත හා ප්‍රචන්ඩ පන්ති ගැටුම්වල ලක්ෂ්‍යයක් කරා වේගයෙන් ලඟාවෙමින් තිබෙන" බව එය සඳහන් කලේය.

වරප්‍රසාදිත ධනපති පාලනයේ අවශ්‍යතාවන් ක්‍රියාවට නැංවීමේ මෙවලම් ලෙස සේවය කර තිබෙන දේශපාලන පක්ෂ දෙක විසින් පරිපාලනය කැරුනු නහර වේලී අසංවේදී වූ ඇමරිකානු දේශපාලන පද්ධතිය, සැලකිය යුතු සමාජ වෙනසක් සඳහා වූ ජනතා ඉල්ලීම් කෙරෙහි ප්‍රගතිශීලී තබා කිසියම් වර්ගයක විශ්වාසජනක, ප්‍රතිචාරයක් හෝ දැක්වීමට ඓන්ද්‍රියව ම අසමත් ව පවත්නා බවය. අවසාන විග්‍රහයේ දී, ප්‍රතිසංස්කරනවාදී ආකාරයක සමාජ වෙනසක් සඳහා වුව කෙරෙන ඉල්ලීම, පාලක ප්‍රභූවේ ධනය හා සමාජ වරප්‍රසාද රැකගැනීම සඳහා වූ දරදඬු අධිෂ්ඨානය සමග සට්ටනය වේ.

අවසානයේ දී ධනපති පක්ෂ දෙක විසින් නම් කරනු ලබන්නේ හා ජනාධිපති ලෙස තෝරා පත්කරගන්නේ කවුරුන් වුවත්, සමාජ හා දේශපාලන වර්ධනයේ තර්කනය ගමන් කරන්නේ පන්ති ගැටුම නොකඩවා උත්සන්න වීම දෙසට ය. තවද, කම්කරු පන්තියේ සමාජ තත්වයේ හා ජීවන කොන්දේසිවල දිග් ගැස්සුනු පරිහානිය ද, සමාජ ධනයේ එය සතු කොටස අඛන්ඩව පහත වැටීම ද, නිෂ්පාදන මාධ්‍ය හිමි කර ගෙන සිටින හා පාලනය කරන අය විසින් සූරාකෑම නිර්දය ලෙස උග්‍ර කිරීම ද කම්කරු පන්තියේ දේශපාලන ගමන් මගේ හා පක්ෂපාතිත්වයේ ප්‍රගාඪ වෙනසකට සඳහා අඩිතාලම දැමෙනු ඇත. පසු ගිය 30 වසර තුල ආර්ථික ජීවිතයේ ඇති කල ඉමහත් වෙනස්කම් ඇමරිකානු කම්කරු පන්තියේ විඥ්ඥානය තුලට කාවද්දා තිබෙන ගැඹුරු අඩයාලම දැකීමට අසමත් හා දැකගැනීම ප්‍රතික්ෂේප කිරීමට පවා ඉදිරිපත්වන අය හෙලිදරව් කරන්නේ දිරිසුන් සංශයවාදය පමනක් නොව, ඉතිහාසය පිලිබඳ තම මුග්ධත්වයයි. සත්තකින්ම, පසුගිය 25 වසරේ විවෘත සමාජ හා පන්ති ගැටුම විරලවීම ඇමරිකානු ඉතිහාසයේ පොදු රටාව සමඟ තියුනු ලෙස නොසැසඳේ. එහෙත්, ජාතික හා සියල්ලටත් වඩා ජාත්‍යන්තර ආර්ථික හා දේශපාලන සන්තතීන්ගේ සංකීර්න හා සුවිශේෂ වූ අන්තර් ක්‍රියාකාරිත්වය තුල මුල් බැසගත් මෙම සමාජ නිහඬතාවයේ දිග් ගැස්සුනු කාල පරිච්ඡේදය දැන් අවසානය කරා ලඟාවෙමින් පවතී. 2008 වසර තුල සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රධාන කර්තව්‍යය වන්නේ න්‍යායික, දේශපාලනික හා සංවිධානාත්මක යන එහි සියලු අංශවල වැඩ කටයුතු පන්ති අරගලය පැන නැගීමෙන් මතුකෙරෙන අභියෝගයන්ට මුහුන දීම සඳහා සූදානම් කර ගැනීමයි.

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සමඟ සහයෝගී වන සමාජවාදී සමානතා පක්ෂය කම්කරු පන්ති අරගලයන් යලි පැන නගින බව සහතිකෙන්ම අපේක්ෂා කරයි. ධනේශ්වර පද්ධතියේ වෛෂයික අර්බුදය ඇමරිකානු මෙන්ම ජාත්‍යන්තර කම්කරු පන්තියේ පිබිදීම සඳහා ප්‍රේරනය සපයන බව අපි ඒත්තු ගෙන සිටිමු. එහෙත් එලඹෙන පිබිදීම සමාජවාදී විඥ්ඥානය වර්ධනය කිරීමේ ගැටලු ඉබේ විසඳලන්නේ නැත.

මෑත මාසවල කම්කරු පන්තියේ මූලික අරගල පෙන්නුම් කර ඇති පරිදි, අර්බුදය පිලිබඳ වෛෂයික විප්ලවවාදී ඇඟවුම් හා දේශපාලන විඥ්ඥානයේ වත්මන් මට්ටම අතර ඇත්තේ ඉමහත් අගාධයකි. වෛෂයික කොන්දේසි කම්කරු පන්තිය අරගලයට යොමු කරනවාක් මෙන්ම, විඥ්ඥානයේ දැවැන්ත පිම්මක් සඳහා පසුබිම ද සකසයි. කම්කරු පන්තියේ දේශපාලන විඥ්ඥානය නැංවීමේ හා, දැන් දුර්වල වී නමුදු ධනපති පාලනයේ අන්තරායකාරීමෙන් ම අත්‍යාවශ්‍ය මුක්කුවක් ලෙස තව දුරටත් පවත්නා නිලධරයේ ප්‍රතිගාමී බලපෑම ජය ගැනීමේ ලා පක්ෂය මගින් කලයුතු අරගලයේ පරිමාව අඩු තක්සේරු කිරීම වැරැද්දක් වනු ඇත. කම්කරු පන්තිය අවමංගත කිරීමටත් ධනේශ්වරයේ "ප්‍රගතිශීලී" කොටස්වලට එය යටත් කර තබා ගැනීමටත් නිරන්තරව වෑයම් කරන නිමක් නැති සුලුධනපති "රැඩිකල්" ප්‍රවනතාවන් විසින් ඉටු කරනු ලබන ක්‍රියා කලාපය ද නොතකා හල නොහැකි ය. කම්කරු පන්තියේ මෙම සියලු විවිධ දේශපාලන ඒජන්සිවල බලපෑම ජයගත හැක්කේ, අතීත විප්ලවවාදී අරගලයන්ගේ මූලෝපායික අත්දැකීම් උකහා ගැනීමට හා ලෝක ධනවාදයේ වර්ධනය වන අර්බුදයේ ඇඟවීම් වටහාගැනීමට සටන් වැදීමෙන් පමනි.[155]

## සසප, හජාජාක හා මාක්ස්වාදය යලි හිස එසවීම

251. ලෝක ආර්ථිකයේ අස්ථාවරත්වය, ගෝලීය භූ දේශපාලන ආතතීන් වර්ධනය වීම, මිලිටරි

ප්‍රචන්ඩත්වය පුපුරා යාම, සෑම රටකම කම්කරු පන්තියේ සමාජ තත්වයන්හි පිරිහීම, පන්ති ගැටුම් ඉහල යාම හා පුලුල් ජන සමූහයන් ස්ථාපිත දේශපාලන ක්‍රමයන්ගෙන් හා සංවිධානවලින් පරත්වාරෝපනය වීම පෙන්වන්නේ විප්ලවවාදී අර්බුදයක් ලඟාවෙමින් ඇති බවයි. අවසාන විග්‍රහයේ දී, අසමතුලිතයේ මෙම පුලුල් වන රටාවේ මූලය සොයාගත යුත්තේ නව ගෝලීය ප්‍රසාරනය හා නිෂ්පාදන බලවේගවල ඒකාග්‍රකරනය සමඟ ධනවාදය විසින් වර්ධනය කල සමාජ සම්බන්ධතා හා දේශපාලන ආකෘතින් එකිනෙකට නොපෑහීම යන කාරනය තුලයි. මෙම විසංවාදය ජයගෙන අතික්‍රමනය කල හැක්කේ, ජාත්‍යන්තර කම්කරු පන්තිය විසින් දේශපාලන බලය සියතට ගෙන. ලෝක ආර්ථිකය සමාජවාදී ආකාරයකට ප්‍රතිසංවිධානය කිරීමෙන් පමනි. එහි අනෙක් පැත්ත ම්ලේච්ඡත්වයයි.

252. මෙම ගෝලීය අර්බුදයේ හරි මැද ඇත්තේ ඇමරිකානු ධනවාදයේ ලෝක තත්වයෙහි බිඳ වැටීමයි. දැවැන්ත ධන සම්පත් හා අධිකාරවත් ලෝක තත්වයට යටින් පැවති කම්කරු පන්තියේ ජනතා දේශපාලන ව්‍යාපාරයක් නොමැතිකම එනම් ඇමරිකානු " සුවිශේෂතාවාදය" සැලකිය යුතු දුරකට ඛාදනය වී ගොසින්ය. 1930 ගනන්වලින් පසුව නොදුටු තරම්, ඇමරිකානු සමාජය පන්ති රේඛා ඔස්සේ ධ්‍රැවාන්ත ගතවී තිබේ. එහෙත් 75 වසරකට පෙර පද්ධතිය ය් කගැනීම සඳහා ඇමරිකානු ධනවාදය ඉදිරිපත් කල ප්‍රතිසංස්කරන විසඳුම් සඳහා අද ඔවුන් අසමත් ය. නිමක් නැති මූල්‍ය සෝලි මාලාවක් හා ව්‍යාපාර බිඳවැටීම්, "නිදහස් ව්‍යවසායකත්වය" පිලිබඳ මහජන විශ්වාසය ගැඹුරට ම ඛාදනය කර තිබේ. කම්කරු පන්තියේ සමාජ විඥානයෙහි හා එහි දේශපාලන බැදීම්වල පෙරලිකාරී ඉතිහාස ගත මාරුව, ඉහල තලයකට පැමින තිබේ. 2000 වසරේ මැතිවරන සොරකම, ඉරාක ආක්‍රමනය සුජාත කිරීම සඳහා ආන්ඩුව ඇදබාන ලද බේගල් හා අබුග්‍රයබ් හා ගුවන්තනාමෝ හීෂන, ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදී ආයතන කෙරෙහි කම්කරු පන්තියේ විශ්වාසය දෙදරවා හලේය. ඓතිහාසික වර්ධනයේ නීතිවලින් එක්සත් ජනපදයට ගැලවී ගත නොහැකිය. එය විප්ලවවාදී පන්ති ගැටුම්වල කාල පරිච්ඡේදයකට ඇතුලුවී තිබේ.

253. විප්ලවවාදී අවධියක දේශපාලන ඉල්ලීම්වලට මුහුන දෙනු ඇත්තේ, කම්කරු පන්තිය වෙත දිශානුගත හා ස්ථිරසාරව ඒ මත පදනම් වූ ද, ඉතාමත්ම දියුනු න්‍යායකින් මඟ පෙන්වන්නා වූ ද, කම්කරු පන්තියේ ජාත්‍යන්තර අරගලවලින් පාඩම් උගත්තා වූ හා සමාජ-ආර්ථික වර්ධනයේ වෛෂයික ප්‍රවනතාවන් පිලිබඳ විද්‍යාත්මක අගැයීමක් මත ඉදිරියට යන ක්‍රියා මාර්ගයක් වර්ධනය කරන පක්ෂයක් පමනි. සමාජවාදී සමානතා පක්ෂය හා ජාත්‍යන්තර කමිටුව විශාල ඓතිහාසික සම්ප්‍රදායක් නියෝජනය කරමින් එය පෙරට ගෙනයයි. තමන්ගේ ම ඉතිහාසය යලි පාදාගැනීමට අවශ්‍ය වුවත් එසේ කල හැකි, වෙනත් කිසිදු දේශපාලන ව්‍යාපාරයක්, ඇත්තේ නැත. සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්, ස්ටැලින්වාදීන්, වෘත්තීය සමිති හා පැබ්ලෝවාදී ප්‍රවනතාවන් වැනි අවස්ථාවාදී සංවිධානවලට තකතිරුකම් හා අපරාධවල සිය අතීත වාර්තාව සිහිපත් කිරීමේ අශාවක් නැත. ඉතිහාසයට හා මූලධර්මවලට අයාචනය කිරීමෙන් ඔවුන්ගේ අවස්ථාවාදී උපාමාරු පිලිබඳ අභ්‍යාසය තුල සිරවීමට ද ඔවුන් අකැමති ය. සිය දේශපාලන කටයුතු ශ්‍රේෂ්ඨ මූලධර්ම මත දැනුවත්ව පදනම් කල හැකි එකම පක්ෂය හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පමනි. එබැවින් කිසිදු හිඩැසකින් තොරව සිය ඉතිහාසය කම්කරු පන්තිය වෙත පිලිගැන්විය හැක්කේ ද එයට ම පමනි. එය සිය ධජය වෙතට කම්කරුවන් හා තරුනයන් අතර අතිශයෙන්ම අධිෂ්ඨානශීලී, ධෛර්‍යය සම්පන්න හා අවංක කොටස් ආකර්ෂනය කර ගනු ඇත.

254. 1938 දී හතරවන ජාත්‍යන්තරය පිහිටුවීම නිමිති කොට ගෙන ට්‍රොට්ස්කි මෙසේ ප්‍රකාශ කලේ ය.

> අප අනෙකුත් පක්ෂ වැනි පක්ෂයක් නො වේ. අපගේ අරමුන වන්නේ සමාජවාදී විප්ලවය තුලින් කම්කරුවන්ගේ හා පීඩිතයන්ගේ පූර්න අධ්‍යාත්මික හා භෞතික විමුක්තිය යි. එය අප හැරෙන්නට අන් කිසිවෙකුත් සූදානම් කරනු ද, මෙහෙයවනු ද නැත. [1156]

255. වසර හැත්තෑවකට පසුව සමාජවාදී සමානතා පක්ෂයත් හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවත් මෙම වචන නව්‍ය වැදගත් කමකින් යුක්තව භාවිතයට ගනියි.

## සමාප්තයි

## සටහන්

141 .*Globalization and the International Working Class: A Marxist Assessment,* භූගෝලීයකරනය හා ජාත්‍යන්තර කම්කරු පන්තිය, මාක්ස්වාදි අගැයීමක්, හජාජාක ප්‍රකාශනය, ඕක් පාර්ක් මේරිං ප්‍රකාශන, 1998 108 පිටුව.

142 එම 109 පිටුව.

143 භූගෝලීයකරනය හා කම්කරු පන්තියෙහි සඳහන්- 109 පිටුව.

144 එම, පි.112

145 ධනේශ්වර නිෂ්පාදනයේ භූගෝලීය කරනය හා කම්කරු පන්තියේ ජාත්‍යන්තර කර්තව්‍යයෝ- සවුත්ෆීල්ඩ්, කම්කරු ප්‍රකාශන, 1993. 8 පිටුව.

146 එම, 52-3 පිටු.

[147]. *The Workers League and the Founding of the Socialist Equality Party,* වර්කර්ස් ලීගය හා සමාජවාදී සමානතා පක්ෂය පිහිටුවීම, ඩේවිඩ් නෝර්ත් විසින්, ඩෙට්රොයිට් කම්කරු ප්‍රකාශන, 1996, 18-19 පිටු.
[148]. එම, පි. 30.
[149]. එම 31-37.
[150]. http://www.wsws.org/sections/category/about about.shtml
[151]. *After the Slaughter: Political Lessons of the Balkan War,* ඩී. නෝර්ත් ''ජන සංහාරයෙන් පසු, බෝල්කන් යුද්ධයේ දේශපාලන පාඩම් '' 1999 ජනවාරි ලෝසවෙඅ http://www.wsws.org/articles/1999/jun1999/balk-14.shtml
[152]. එම.
[153]. ඇමරිකානු ධනවාදයේ අර්බුදය හා ඉරාකයට එරෙහි යුද්ධය, 2003 මාර්තු, ලෝසවෙඅ http://www.wsws.org/articles/2003/mar2003/iraq-m21.shtml
[154]. ධනවාදයේ ලෝක අර්බුදය හා සමාජවාදය සඳහා ඉදිරි දැක්ම, නික් බීම්ස් http://www.wsws.org/articles/2008/feb2008/nbe2-f01.shtml
[155]. ලෝක ධනේශ්වර පද්ධතියේ දේශපාලන හා ආර්ථික අර්බුදය ද සමාජවාදී සමානතා පක්ෂයේ ඉදිරි දර්ශනය හා කර්තව්‍යයන් ද පිලිබඳ සටහන්. ඩේවිඩ් නෝර්ත්, http://www.wsws.org/articles/2008/jan2008/rept-j11.shtml
[156]. *The Founding of the Fourth International,* හතරවන ජාත්‍යන්තරයේ පදනම්, ලියොන් ට්‍රොට්ස්කි ලියවිලි (1938-39) නිව් යෝර්ක් පාත් ෆයින්ඩර්, 2002. පි. 93.

© www.wsws.org